# වසංගත රෝග විද්‍යා අංශය

**සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යංශය**

**231, ද සේරම් පෙදෙස, කොළඹ 01000**

**දුර**: (+94 11) 2695112, 4740490, 2681548 **ෆැක්ස්**: (+94 11) 2696583 **ඊ මේල්**: chepid@sltnet.lk, epidunit@sltnet.lk **වෙබ්**: www.epid.gov.lk


මගේ අංකය : එපිඩ්/22/2008

2008 අප්‍රේල් 29

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,

සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,

## අධික වැසි හා ගං වතුර හේතුවෙන් ජලය ආශ්‍රිත රෝග පැතිරයාම පාලනය හා එම රෝග වැලැක්වීම සඳහා ගත යුතු පියවර

දිවයිනේ සමහර ප්‍රදේශවල දැනට පවතින අධික වැසි සහිත කාලගුණය හා ඒ හේතුවෙන් ඇතිවූ ගංවතුර නිසා ජලය ආශ්‍රිතව පැතිර යන රෝග වැඩි වීමේ අවදානමක් ඇත. පානීය ජල මූලාශ්‍ර, නොපිසූ එළවළු සහ පළතුරු අපිරිසිදු වීම හා සනීපාරක්ෂක පද්ධතිය බිඳ වැටීම නිසා ජලය ආශ්‍රිතව පැතිර යන පාචනය, රක්ත අතීසාරය වැනි රෝගද, වැසි ජලය එකතු වන ස්ථාන බහුල වීම නිසා මදුරු වාහකයන් මඟින් පැතිරෙන ඩෙංගු, චිකුන්ගුන්යා වැනි රෝගද පැතිරීමේ අවදානමක් ඇත. මෙම තත්වයන් පාලනය කිරීමට සහ වැලැක්වීමට ක්ෂේත්‍ර මට්ටමින් ක්ෂණික පියවර ගත යුතුය.

ඔබ ප්‍රදේශයේ අධික වැසි ඇත්නම් අනුගමනය කළයුතු මූලික ක්‍රියාමාර්ග පහත දක්වේ.

1. ඔබ ප්‍රදේශයේ පිහිටුවා ඇති ආපදා කළමනාකරණ කමිටු කැඳවා පවතින තත්වය සහ ගත යුතු ක්‍රියා මාර්ග ගැන සාකච්ඡා කිරීම.
2. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මට්ටමේ කුඩා කණ්ඩායම් පිහිටුවා අවදානම් සහිත ප්‍රදේශ වල අවශ්‍ය සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු සිදු කිරීම. මේ සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් ප්‍රාදේශීය ලේකම් සමග සාකච්ඡා කොට එම නිලධාරින් සමග සහයෝගයෙන් ක්‍රියා කළ යුතුය.
3. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් / මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරුන් තම ප්‍රදේශවල වසංගත රෝග තත්වයන් ඇතිවීම සම්බන්ධයෙන් විමසිලිමත් විය යුතු අතර එවැනි තත්වයන් ඇති වුවහොත් තම ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ හට සහ කොළඹ වසංගත රෝග විද්‍යා අංශයට වහාම දැනුම් දීමට හා එම වසංගත තත්වය පාලනය කිරීම සඳහා කඩිනම් පියවර ගැනීමට වග බලා ගත යුතුය.
4. මහජනතාවට අවශ්‍ය සෞඛ්‍ය උපදෙස් ලබා දිය යුතු අතර මේ වැසි සමය තුළ උණුකර නිවාගත් ජලය පානය කිරීම සහ ආහාර වල පවිත්‍රතාවය රැක ගැනීම පිළිබඳව ඔවුන්ගේ විශේෂ අවධානය යොමු කළ යුතුය.
5. පානීය ජලය ලබා ගන්නා ළිං ක්ලෝරිනීකරණය කිරීම.
6. කැළි කසල සහ අනෙකුත් අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම සම්බන්ධව ප්‍රජාව දැනුවත් කිරීම.

සියළුම මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන් සහ අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන් ඉහත දක්වා ඇති ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු අතර එම ක්‍රියාකාරකම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් ගේ අධීක්ෂණය යටතේ සිදුවිය යුතුය.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු අතර තම ප්‍රදේශයේ වසංගත රෝග තත්වයන් වළක්වා ගැනීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සහ ඔහුගේ / ඇයගේ කාර්යමණ්ඩලයේ කාර්යක්ෂමතාව මත රඳා පවතී.ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ විසින් තම ප්‍රදේශයේ සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ වල සිදු කෙරෙන ක්‍රියාකාරකම් පිළිබඳව සොයා බලා අධීක්ෂණය කළ යුතුය. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් මෙම කටයුතු වලදී පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගෙන්, නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගෙන් සහ වසංගත රෝග විද්‍යාඥගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගත යුතුය.

ඔබට මේ සම්බන්ධව යම් ගැටළුවක් ඇත්නම් හෝ උපදෙස් ලබා ගැනීමට අවශ්‍ය නම් කරුණාකර අවශ්‍ය ඕනෑම වේලාවක මා අමතන්න.

**වෛද්‍ය එම්. ආර්. එන්. අබේසිංහ**
**ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ**

**පිටපත් :**

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජෙනරාල්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (මහජන සෞඛ්‍ය සේවා)
අධ්‍යක්ෂ (සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය)
අධ්‍යක්ෂ (වෛද්‍ය පර්යේෂණායතනය)
සියළුම ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥවරුන්
සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්